**ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව අංශයේ (TVET) පෞද්ගලික අංශය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා නව්‍ය ප්‍රවේශයන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය -2023**

---

ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව අංශයේ (TVET) පෞද්ගලික අංශය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා නව්‍ය ප්‍රවේශයන් ඇතිකිරීමේ ව්‍යාපෘතියේ 2023 ජනවාරි 01 සිට ඔක්තෝබර් 30 දිනෙන් අවසන් මාස දහය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 11 දින එළඹි අංක 9193 එස්ආර්අයි (එස්එෆ්) දරන ප්‍රදාන ගිවිසුමේ (IV) ව්‍යවස්ථාවේ 4.02(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ,අරමුණු ,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, එවකට නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය ඉහළ නැංවීමට සහ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව තුළින් කාන්තා ආර්ථික සවිබල ගැන්වීමට දායක වීම ව්‍යාපෘතියේ සමස්ත අරමුණ වේ. ව්‍යාපෘතිය ඒ සහ බී යන සංරචකවලින් සමන්විත වන අතර සංරචක ඒ යටතේ (i) තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා පුද්ගලික අංශයේ දායකත්වය ශක්තිමත් කිරීම (ii) කාන්තාවන් කෙරෙහි අවධානය යොමු කරමින් ස්වයං රැකියා සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන වැඩි දියුණු කිරීම (iii) සාම්ප්‍රදායික නොවන ක්ෂේත්‍රවලට කාන්තාවන් ආකර්ෂණය කර ගැනීම සඳහා කාන්තාවන් ඉලක්ක කරගත් දිරිගැන්වීම් ලබා දීම, උපදේශනය සහ රැකියා පුහුණුව (iv) පෞද්ගලික අංශයේ ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළත් බඳවා ගැනීම් සහ සේවා පරිසරය ඇති කිරීම (v) නිපුණතා අංශයට කොවිඩ්-19 බලපෑමට කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්වීම යනාදි සංරචක 5ක් වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 534කට සමාන එ.ජ.ඩො මිලියන 3ක් වන අතර දරිද්‍රතාව අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල ප්‍රදානයක් ලෙස මූල්‍යනය කිරීමට එකඟ වූ අතර ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුව පරිපාලනය කරනු ලැබේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 නොවැම්බර් 16 දින ආරම්භ කරන ලද අතර 2021 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, 2023 ජුනි 30 දක්වා දෙවතාවක් දීර්ඝ කර තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු 2023 ඔක්තෝබර් 31 දින අවසන් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2023 ඔක්තෝබර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් විස්තරය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කෘෂි තාක්ෂණ ව්‍යාප්ති මධ්‍යස්ථානය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් සහ වෙබ් අඩවියක් සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 2.5ක් වෙන් කර තිබුණි. කෙසේවෙතත්, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් යල් පැන ගිය සහ වංචාකාරී මිල ගණන් සහ පිරිවිතරවල ඇතුළත් නොවූ නිර්ණායක භාවිත කරමින් විනිවිදභාවයකින් තොරව සේවා සපයන්නෙකු තෝරාගෙන තිබුණි. | කෘෂි තාක්ෂණ ව්‍යාප්ති මධ්‍යස්ථානයෙන් ලැබී ඇති තොරතුරු අනුව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදනය කර ඇති බව ඔවුහු තහවුරු කරන ලදි. ප්‍රසම්පාදනය කෘෂි තාක්ෂණ ව්‍යාප්ති මධ්‍යස්ථානය මගින් සිදු කරන ලදි. | විනිවිදභාවයෙන් යුතුව සේවා සපයන්නකු තෝරාගත යුතුය. |
| (ආ) | තාක්ෂණික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශයේ (TVET) පාඨමාලා සම්පූර්ණ කරන ශිෂ්‍යයන් සහ කර්මාන්තකරුවන් ලියාපදිංචි කර සේවාව ලබා ගැනීමේ අරමුණින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත නිපුණතා සභාව විසින් රු. මිලියන 11.23ක පිරිවැයකට ජංගම යෙදුමක් (mobile App) සංවර්ධනය කරන ලදි. කෙසේවෙතත්, ජංගම යෙදුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් නොමැතිකම හේතුවෙන් යෙදුම සමඟ ලියාපදිංචි වූ සභාවට, සිසුන්ට සහ කර්මාන්තකරුවන්ට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා එය දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී. එබැවින්, ඉහත යෙදුම සංවර්ධනය කිරීමට දරන ලද වියදම නිෂ්ඵල වේ. | ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගම සමඟ හවුල්කාරිත්වයක් ඇති කර ගැනීමට කවුන්සිලය තීරණය තිබුණි. නිෂ්පාදන සමාලෝචන සැසි කිහිපයකින් පසුව, ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් ප්‍රෝ කනෙක්ට් (Pro Connect) යෙදවුම භාවිත කිරීමට එකඟ වූ අතර අවබෝධතා ගිවිසුමකට (MOU) අත්සන් කරන ලදි. කෙසේවෙතත්, ඔවුන්ගේ තාක්ෂණික සහ අලෙවි කණ්ඩායම් දැනට වෙනත් ව්‍යාපෘතියක නියැලී සිටින නිසා Pro Connect වෙත ඔවුන්ගේ අවධානය යොමු කිරීම ප්‍රමාද වී ඇති බව ඔවුන් පසුව සභාවට දන්වන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නිෂ්පාදිතය දැනට නිශ්කාර්ය පවතී. | සංවර්ධිත ජංගම යෙදුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ක්‍රියාකාරකම් 4.2.1.1 යටතේ ඩ්‍රෝන උපකරණ මිලදී ගැනීම සඳහා පර්යේෂණ සංවර්ධන පුහුණු ආයතනයට රු මිලියන 8.86ක් ප්‍රදානය කර තිබුණි. උපකරණ ක්‍රියාත්මක කිරීමට දැනුමක් ඇති උපදේශකයකු නොමැතිකම හා ආයතනය පුහුණු ආයතනයක් ලෙස නිසි ලෙස ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් මිලදී ගත් ඩ්‍රෝන උපකරණ ව්‍යාපෘති යෝජනාවේ සඳහන් පරිදි පුහුණු හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රයෝජනයට නොගෙන ආයතනයේ නිෂ්කාර්ය පැවතින බව 2024 මැයි 02 වැනි දින සිදු කරන ලද භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද, ආයතනය මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවල ප්‍රගතියක් නොලැබුණි. | පර්යේෂණ සංවර්ධන පුහුණු ආයතනය (IRDT) විසින් උතුරු පළාත පුරා ASSC සමඟ පුහුණුව ලැබූ සහතික ලත් ඩ්‍රෝන් නියමුවන් 7 දෙනෙකු සිටී. ඩ්‍රෝන වසර පුරා භාවිත නොකරන අතර ඒවා කෘෂිකාර්මික කටයුතු සඳහා සෘතුමය වශයෙන් භාවිත වේ. සෘතුමය නොවනවිට, ඩ්‍රෝන නිෂ්පාදකයන් විසින් ලබා දෙන උපදෙස් අනුව ඒවා ගබඩා කරනු ලැබේ. | ඩ්‍රෝන් උපකරණ ඵලදායි ලෙස භාවිත කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ව්‍යවසායකයෙකු සමඟ ඇති කර ගත් ගිවිසුමකට අනුව, මීටර් 1ක් පළල, මීටර් 0.15 ඝණකම සහ දිග මීටර් 1207ක් සහිත පැල තවානක මාර්ග පද්ධතියක් ඉදිකිරීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද මිනුම් පත්‍රයට අනුව, පළල මීටර් 1.22, ඝණකම මීටර් 0.15 සහ දිග මීටර් 719 ක් වන මාර්ග පද්ධතියක් ඉදිකර තිබුණු අතර ව්‍යවසායකයා විසින් ඉදිකරන ලද මාර්ගයේ දිග තහවුරු කිරීමකින් තොරව ව්‍යවසායකයාට මුළු ප්‍රදානය රු. මිලියන 3.22 ක් ප්‍රතිපූරණය කර තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ විය. වරලත් ඉංජිනේරුවරයාගේ නිර්දේශය මත ගෙවීම් සිදුකර ඇත. කෙසේඅවෙතත්, පුද්ගලික අංශයේ නියුතු විශේෂඥයා භෞතික සත්‍යාපනය සිදුකර නොතිබුණි. විගණන වාර්තාවේ සඳහන් කරුණු සත්‍යාපනය කිරීම සඳහා අප දැනට භෞතික සත්‍යාපනයක් සිදු කරමින් සිටින අතර වාර්තාව කියවීමෙන් පසු එම කරුණ නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | මංසන්ධි ලගාකර කර ගැනීම තහවුරු කිරීමෙන් පසු ව්‍යවසායකයාට මුදල් ප්‍රතිපූර්ණය කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | මංසන්ධි 02ක් ළගාකර ගැනීම සඳහා ව්‍යවසායකයෙකු වෙත එකතුව රු. මිලියන 3.51ක් ලබා දී තිබුණි. ගිවිසුමට අනුව, ඉන් මංසන්ධි 01 යටතේ NVQ පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු අතර එය TVEC/NAITA සහතිකය හරහා සත්‍යාපනය කිරීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, NVQ සහතික නිකුත් කිරීමේ බලය TVEC ආයතනය වෙත පමණක් වුවද අදාළ පුහුණු මධ්‍යස්ථානය විසින් NVQ 3 සහතික නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය. | ඒ වන විට අපේක්ෂිත වැඩසටහන සඳහා NVQ සහතික නිකුත් කිරීමට ලියාපදිංචි වී ප්‍රතීතනයලත් ආයතනයක් නොතිබුණි. කෙසේවෙතත්, සිනමන් පුහුණු අධ්‍යාපන ආයතනය (Cinnamon Training Academy) 2021.04.26 දින දක්වා මෙම සහතිකය නිකුත් කිරීමේ ප්‍රතීතනය ලබාගෙන තිබුණි. ඒ වන විට ඔවුන් ප්‍රතීතනය කර නොතිබුණද ඔවුන්ට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) හි වලංගු ලියාපදිංචියක් තිබුණි. එබැවින්, සිනමන් පුහුණු අධ්‍යාපන ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකය ඊළඟ හොඳම විකල්පය ලෙස පිළිගනු ලැබීය. | NVQ සහතිකය පිළිගත හැකි ආකාරයෙන් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | අමාත්‍යාංශයට උපකරණ ලබා ගැනීම ඇතුළුව සුහුරු පන්ති කාමර 32ක් ස්ථාපිත කිරීම සඳහා එකතුව එ.ජ.ඩො 911,540කට සමාන රු මිලියන 293.07ක් වැය කර තිබුණි.<br><br>ලබා දී ඇති තොරතුරු වලට අනුව, දේශකයින් සඳහා පිරිවැය රු මිලියන 5.67ක් වන ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) 400ක් ප්‍රසම්පාදනය කර තිබුණි.<br><br>කෙසේවෙතත්, පුහුණු මධ්‍යස්ථාන 32ක් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය 320ක් පමණක් වෙන්කර තිබුණි. එබැවින්, ප්‍රසම්පාදනය කරන ලද රු. මිලියන 1.13ක් වටිනා ඉතිරි ඉගෙනුම් කළමනාකරණ පද්ධති 80 වෙන් කිරීම පිළිබඳව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, දේශකවරුන් සඳහා වෙන් කර ඇති ඉගෙනුම් කළමනාකරණ | දේශකයන් හා සිසුන් විසින් ඉගනුම් කළමනාකරණ පද්ධතිය (LMS) අඩු භාවිතයට සහ ඊට හේතුව පුහුණුව නොමැතිකමට යනාදිය සඳහා එකඟ වේ. අරමුදල් පවතින විට මෙම කාරණය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරමින් පුහුණුවක් ලබා දීමට අමාත්‍යාංශය සැලසුම් ඇත. | සුහුරු පන්ති කාමර අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීම පිළිබඳව පසු විපරම් කළ යුතුය. |

පද්ධති 320 න්, සියයට 57ක් නියෝජනය කරන ඉගෙනුම් කළමනාකරණ පද්ධති 183ක් අධ්‍යයන කටයුතු සඳහා යොදා ගෙන තිබුණි. ඉහත ඒවාට අමතරව ප්‍රසම්පාදනය කර සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා වෙන් කරන ලද රු මිලියන 45.37ක් වටිනා ඉගෙනුම් කළමනාකරණ පද්ධති 3,200න්, සියයට 24ක් නියෝජනය කරන ඉගෙනුම් කළමනාකරණ පද්ධති 753ක් පමණක් අධ්‍යයන කටයුතු සඳහා භාවිත කර ඇති අතර දේශකයින් සඳහා පුහුණු නොමැතිවීම, පාඨමාලා හදාරන සිසුන් සඳහා පුහුණු ද්‍රව්‍ය සහ පහසුකම් නොමැතිකම හේතුවෙන් කිසිදු ශිෂ්‍ය බලපත්‍ර (student license) භාවිත නොකළ පුහුණු මධ්‍යස්ථාන 16 ක් පැවතුණි. එබැවින්, නියමු ව්‍යාපෘතියේ සඵලතාවය අඩු මට්ටමක පැවතුනි.

## 2.2 අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | අභ්‍යන්තර විගණනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය මගින් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |